# දැන්වීමයි

# පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
# නැගෙනහිර පළාත

**නැගෙනහිර පළාතේ, පළාත් පාසල්වල පවතින සිංහල හා දෙමළ මාධ්‍ය ගුරු පුරප්පාඩු සඳහා (2023 හා 2024 වර්ෂයන්හිදී කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් බඳවාගැනීමට අනුමැතිය ලබා දී තිබූ පුරප්පාඩු සංඛ්‍යාවෙන් ඉතිරි වූ පුරප්පාඩු සඳහා) ශ්‍රී ලංකා ගුරු සේවයේ 3-I (අ) ශ්‍රේණියට උපාධිධාරීන් බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2025**

උක්ත කරුණට අදාලව 2025.04.17 දිනැතිව මවිසින් "දිනමිණ" හා "තිනකරන්" යන පුවත්පත් වල පළකළ දැන්වීම් හා නැගෙනහිර පළාත් සභා වෙබ් අඩවියේ පළ කරන ලද දැන්වීම සම්බන්ධයෙනි.

ඒ අනුව අදාල දැන්වීමෙහි "උපලේඛන 1" යටතේ "විෂය අංක 03" සහ "විෂය අංක 15" ට අදාලව පහත සංශෝධනය සිදුකරන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**සංශෝධනය**

| විෂයය අංකය | විෂයය | අධ්‍යාපන සුදුසුකම් |
|---|---|---|
| 03 | ඉංග්‍රීසි (English) | පිළිගත් විශ්වවිද්‍යාලයකින් ඉංග්‍රීසි භාෂාව හදාරා ඇති උපාධියක් /ඉංග්‍රීසි භාෂාව/ඉංග්‍රීසි සාහිත්‍යය/ඉංග්‍රීසි වාග් විද්‍යාව/ඉංග්‍රීසි පිළිබඳ TESL (Teaching English as a Second Language) විෂයයෙන් අවම වශයෙන් සම්මාන 30 ක් (Credits) සහිතව ශාස්ත්‍රවේදී උපාධියක් ලබා තිබිය යුතුය.<br><br>**හෝ**<br><br>ඕනෑම උපාධියක් සමග රජයේ පිළිගත් ආයතනයකින් වසර 2කට නොඅඩු HNDE (Higher National Diploma in English) උසස් ජාතික ඩිප්ලෝමාවක් ලබා තිබිය යුතුය. |
| 15 | සාමාන්‍ය ඉංග්‍රීසි (General English ) | පිළිගත් විශ්වවිද්‍යාලයකින් ඉංග්‍රීසි භාෂාව හදාරා ඇති උපාධියක් /ඉංග්‍රීසි භාෂාව/ඉංග්‍රීසි සාහිත්‍යය/ඉංග්‍රීසි වාග් විද්‍යාව/ඉංග්‍රීසි පිළිබඳ TESL (Teaching English as a Second Language) විෂයයෙන් අවම වශයෙන් සම්මාන 30 ක් (Credits) සහිතව ශාස්ත්‍රවේදී උපාධියක් ලබා තිබිය යුතුය.<br><br>**හෝ**<br><br>ඕනෑම උපාධියක් සමග රජයේ පිළිගත් ආයතනයකින් වසර 2කට නොඅඩු HNDE (Higher National Diploma in English) උසස් ජාතික ඩිප්ලෝමාවක් ලබා තිබිය යුතුය. |

තවද රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 27/88 හි විධිවිධාන අනුව, පත්වීම් ලබා දීමේදී පවත්නා පුරප්පාඩු ප්‍රමාණයෙන් 3% ක් විශේෂ අවශ්‍යතා ඇති අය සඳහා (ආබාධිත) වෙන් කරනු ලැබේ. පත්වීම් සඳහා තෝරාගනු ලබන අවස්ථාවේදී අදාල තනතුරේ සේවය කිරීමට තම විශේෂ අවශ්‍යතා තත්ත්වය (ආබාධිත තත්ත්වය) බාධාවක් නොවන බවට විශේෂ වෛද්‍ය පරීක්ෂණ වාර්තාවක් මගින් සනාථ කළ යුතුය. එසේ වුවද විශේෂ අවශ්‍යතා ඇති අපේක්ෂකයෙකු පත්වීම් ලබා ගැනීම සඳහා සුදුසුකම් ලැබීමට නම් ලිඛිත හා ප්‍රායෝගික පරීක්ෂණ වලින් නියමිත ලකුණු ලබා තිබිය යුතුවේ.

එසේම අයදුම්පත්‍ර භාරගන්නා අවසාන දිනය **2025.05.26** දින දක්වා දීර්ඝ කරනු ලබන බව දන්වන අතර නැගෙනහිර පළාත් සභා වෙබ් අඩවියේ පළ කරන ලද බඳවාගැනීම් දැන්වීමෙහි සඳහන් අනෙකුත් කොන්දේසි එලෙසින්ම බල පැවැත්වේ.

**ජේ. ලියාකත් අලි,**
ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
නැගෙනහිර පළාත.

**2025.05.12**